සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය 2018 | 11 ශ්‍රේණිය |
| முதலாம் தவணைப் பரீட்சை 2018 | தரம் 11 |
| **Therd Term Test 2018** | **Grade 11** |

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව | I II | පැය තුනයි |
| **Geography** | **I II** | **Three hours** |

සැ.යු.:

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විතයි.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

---

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නවල හිස්තැන්වලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

(01) ගැඹුරු සාගරයේ යමහල් ක්‍රියාකාරීත්වය නිසා .............................. දූපත නිර්මාණය වී ඇත. (මැඩගස්කරය/ ෆෝක්ලන්ඩ්/ අයිස්ලන්තය)

(02) ලෝම ලැටරයිට් පස (Loam and Laterite soil) වඩාත් යෝග්‍ය වන්නේ, ........................ වගාවටය. (රබර්/ තේ/ ගම්මිරිස්)

(03) ශ්‍රී ලංකාවේ කිරි ගව සම්පත් මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ .......................... ය. (මී වන පලාන/ කනත්විය/ වල්පිට)

(04) ලෝකයේ විද්‍යුත් උපකරණ නිෂ්පාදනයේ වැඩිම දායකත්වයක් හිමිවන්නේ ........................... උපකරණ සඳහාය. (කාර්මික හා වෛද්‍ය/ දත්ත සැකසීමේ/ සන්නිවේදන)

(05) උසස් තත්වයේ පිඟන් භාණ්ඩ නිෂ්පාදනයට .............................. යොදා ගනී. (කිරි මැටි/ බෝල මැටි/ අකුරු මැටි)

(06) පුනර්ජනනීය ස්වභාවික සම්පතක් ලෙස ............................... ගත හැකිය. ( නළ ජලය/ සරු පස/ මත්ස්‍යයන්)

(07) ශ්‍රී ලංකාවේ පරම ආර්ථික කලාපයට අයත් වන්නේ, නාවික සැතපුම් ................................ දුර සීමාවයි. ( 12-24/ 24-100/ 24-200)

(08) ග්‍රැනයිට් පාෂාණය විපරිත වීමෙන් ............................... පාෂාණය නිර්මාණය වේ. (නයිස්/ හුණුගල්/ ඩොලමයිට්)

(09) ක්‍රි.ව. 2012 ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය වර්ග කිලෝ මීටරයට පුද්ගලයින් ............................. කි. ( 327/ 324/ 325 )

(10) අතු ගංගා කොටු දැලක ආකාරයෙන් ප්‍රධාන ගංගාවට එකතු වීම ............... ජලවහන රටාව ලෙස හැඳින්වේ. (අරීය/ ශාඛීය/ ජාලාකාර)

- අංක 11-15 දක්වා දී ඇති ප්‍රශ්නවල එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් "නි" යන්න වටාද වැරදි නම් "වැ" යන්න වටාද රවුමක් අඳින්න.

(11) කපු පිළි කර්මාන්තය කෘෂි පාදක අමුද්‍රව්‍ය මත පදනම් වී ඇත. (නි/ වැ)

(12) ශ්‍රී ලංකාවේ මෙට්‍රික් ජාලය සකස් කිරීමේ පාද ලක්ෂ්‍යය ඉන්දියන් සාගරයේ පිහිටා ඇත. (නි/ වැ)

(13) ජාල උතුර හා සැබෑ උතුර අතර කෝණික පරතරය $4^0$ කි (නි/ වැ)

(14) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතිකය 0.7% කි (නි/ වැ)

(15) රටක සංවර්ධනය මැනීමේදී භාවිතයට ගනු ලබන මූර්ත ද.ජා. නිෂ්පාදිතය පැරණි මිනුමකි (නි/ වැ)

- අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න වල "අ" සහ "ආ" යනුවෙන් තීර දෙකක් දක්වේ. ඒවායේ සම්බන්ධතාවය අනුව ගැළපූ විට පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

(16) "අ" "ආ"

| "අ" | "ආ" |
|---|---|
| 1. උෂ්ණ කාන්තාර ප්‍රදේශ | A- අන්දීස් |
| 2. කඳුකර ප්‍රදේශ | B- ආර්ක්ටික් |
| 3. ශීත කාන්තාර ප්‍රදේශ | C- සහරා |
| | D- කොංගෝ |

1. CBA 2. CAB 3. CDA 4. CDB

(........................)

(17)

| "අ" | "ආ" |
|---|---|
| 1. වී වාගව | A- මැලේසියාව |
| 2. තිරිඟු වගාව | B- ඉතාලියේ පෝ ගංගා නිම්නය |
| 3. රබර් වගාව | C- ආර්ජන්ටිනාව |
| | D- ඇමෙරිකා එක්සත් ජනපදය |

1. BDA 2. BAC 3. CDA 4. ABD

(........................)

(18)

| "අ" | "ආ" |
|---|---|
| 1. ජල විදුලි බලය | A- පුත්තලම |
| 2. සූර්ය ශක්තිය | B- ගොන්නෝරුව |
| 3. සුළං ශක්තිය | C- කැනියෝක් |
| | D- සාම්පූර් |

1. ABD 2. BDA 3. CBA 4. BCA

(........................)

(19) "අ" "ආ"

1. රූටයිල් A- නිලාවේලි
2. ඉල්මනයිට් B- බලංගොඩ
3. සර්කෝන් C- නාත්තණ්ඩිය
D- පුල්මුඩේ

1. DAB 2. DBA 3. CDA 4. ACD

(........................)

(20) "අ" "ආ"

1. A මහල A- මව් පාෂාණ
2. B මහල B- හියුමස්
3. C මහල C- මැටි වර්ග
D- විවිධ කාරක

1. DCA 2. BCA 3. CAB 4. ADB

(........................)

- **අංක 21-25 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

(21) මිනිරන් වර්ග කිරීමේදී ඉතා පිරිසිදු කුට්ටි වශයෙන් තිබෙන්නේ ............................ මිනිරන් ය.

(22) ශ්‍රී ලංකාවේ වයස් ව්‍යුහය අනුව ශ්‍රම බලකාය ලෙස සැලකෙන්නේ වයස අවුරුදු ........................... අතර ජන සංඛ්‍යාවයි.

(23) විද්‍යාත්මක හා පර්යේෂණ කටයුතු සඳහා පමණක් ................................... රක්ෂිත විවෘතව පවතී.

(24) ශ්‍රී ලංකාවේ අඩු වියදම් බලශක්ති උත්පාදනය සම්බන්ධ අවධානය යොමු කිරීම සඳහා .................................... අධිකාරිය පිහිටුවා ඇත.

(25) රටක ජන සංඛ්‍යාව වයස් කාණ්ඩ හා ප්‍රමිතිරි ව්‍යුහය අනුව දක්වන ප්‍රස්තාරය .......................... යනුවෙන් හැඳින්වේ.

- **අංක 26 සිට 28 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා සපයා ඇති ශ්‍රී ලංකා සිතියම යොදාගන්න.**

(26) ජන සංඛ්‍යාව අඩුම දිස්ත්‍රික්කය දක්වෙන්නේ .................. අක්ෂරයෙනි.

(27) සාමාන්‍ය වාර්ෂික ජන සංඛ්‍යා වර්ධන වේගය වැඩිම දිස්ත්‍රික්කය දක්වෙන්නේ .................... අක්ෂරයෙනි.

(28) ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණ ආයතනය පිහිටා ඇති දිස්ත්‍රික්කය දක්වෙන්නේ ..................... අක්ෂරයෙනි.



- අංක 29-30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා සපයා ඇති ප්‍රස්තාරය උපකාර කර ගන්න.




(29) ප්‍රස්තාරයට අනුව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ වර්ධනය ඉහළම අගයක් ගන්නා වර්ෂය වන්නේ ............................................ යි

(30) ඉහත ප්‍රස්තාර වර්ගය හඳුන්වන්නේ, ................................ ප්‍රස්තාර යනුවෙනි.

- **අංක 31 සිට 40 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා ලබාදී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

(31) ශ්‍රී ලංකාවේ කෘෂි පුහුණු මධ්‍යස්ථාන සම්බන්ධව නිවැරදි සම්බන්ධය දක්වෙන ප්‍රකාශය වන්නේ,

1. මාතලේ - සුළු අපනයන භෝග
2. ගන්නෝරුව - මාංශ භෝග
3. අගුණකොළ පැලැස්ස - කජු වගාව
4. කටුගම්පල - මිරිස් වගාව (..................)

(32) ශ්‍රී ලංකාවේ දැඩි ස්වභාවික රක්ෂිතයක් නොවන්නේ මින් කුමක්ද?

1. හග්ගල
2. සිංහරාජය
3. යාල
4. රිටිගල (..................)

(33) 1:50,000 භූ ලක්ෂණ සිතියමක පර්යන්ත තොරතුරු ලෙස වට තීරුවේ පහළ කොටසේ නිරූපණය වන්නේ,

1. පරිමාණය, සිතියමේ නම
2. දිශාව, සිතියමේ අංකය
3. දිශාව, පරිපාලන මායිම්
4. යාබද සිතියම් , සූචකය (..................)

(34) ඇමෙරිකා එක්සත් ජනපදයේ යකඩ හා වානේ කර්මාන්තයට ප්‍රසිද්ධ මධ්‍යස්ථානය මින් කුමක්ද?

1. කෝබේ
2. ඩෙට්රොයිට්
3. කුෂ්නෙට්ස්ක්
4. දකුණු වේල්ස් (..................)

(35) ආසියා මහද්වීපික තටකය තුල පිහිටි දූපතක් වන්නේ,

1. ජාවා දූපත
2. මැඩගස්කර දූපත
3. පැපුවා නිව්ගීනියා දූපත
4. තස්මේනියා දූපත (..................)

(36) කඳුකර තෙත් කලාපීය වනාන්තර ආශ්‍රිතව ව්‍යාප්ත වී ඇති ශාක යුගලය තෝරන්න.

1. දිය කඳුරු, එරමිණියා
2. සපු, වල්දෙල්
3. මහරත්මල්, වෙලං
4. මිහිරිය, මිල්ල (..................)

(37) ශ්‍රී ලංකාවේ යෝජිත අධිවේගී මාර්ගයක් නොවන්නේ මින් කුමක්ද?

1. කොළඹ - යාපනය
2. කොළඹ - මහනුවර
3. මාතර - හම්බන්තොට
4. කොළඹ - කටුනායක (..................)

(38) මානුෂ සංවර්ධන දර්ශකය අනුව ලෝකයේ රටවල් බෙදිය හැකි කාණ්ඩ සංඛ්‍යාව වන්නේ,

1. 04 කි
2. 03 කි
3. 02 කි
4. 06 කි (..................)

- **අංක 39 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගන්න.**

A - සම්පත් හිඟය

B - ඕසෝන් වියන ක්ෂය වීම

C - දේශගුණ විපර්යාස

D - භෝග ඵලදාව

E - විකල්ප සම්පත් සෙවීම

(39) එක් සාධකයක වැඩිවීම වෙනත් සාධකයක වැඩිවීම කෙරෙහි බලපෑමක් ඇතිකරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුලත් පිළිතුර වන්නේ,

1. A හා D  2. C හා E

3. A හා E  3. A හා D

(40) එක් සාධකයක වැඩිවීම වෙනත් සාධකයක අඩුවීම කෙරෙහි බලපෑමක් ඇතිකරන බවට දැක්වෙන ප්‍රකාශය අඩංගු අක්ෂර දෙක ඇතුලත් පිළිතුර වන්නේ,

1. C හා D  2. C හා E

3. A හා E  3. A හා D

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය 2018 | 11 ශ්‍රේණිය |
| முதலாம் தவணைப் பரீட்சை 2018 | தரம் 11 |
| **Therd Term Test 2018** | **Grade 11** |

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I II |
| வரலாறு | I II |
| **Geography** | **I II** |

සැ.යු. : පළමු ප්‍රශ්නය (I කොටස) අනිවාර්යය වන අතර II කොටසින් ප්‍රශ්න 4 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

## I කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු දීම සඳහා ඔබ වෙත දපයා ඇති කඩදාසිය යොදා ගන්න.

අංක (i) සිට (iii) දක්වා ඇති ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.




1:50,000

i. අංක 01 න් දක්වා ඇත්තේ කුමක්ද? ........................................................................ (ල. 1)
(ගං දඟරය, හැඩපළු ගංගාව, ගං දූපත්)

ii. අංක 02 න් දක්වා ඇත්තේ කුමක්ද? ........................................................................ (ල. 1)
(ලඳු කැලෑ, හේන, වනාන්තරය)

iii. අංක 04 න් දක්වා ඇත්තේ කුමක්ද? ........................................................................ (ල.1)
(අතරමැදි සමෝච්ච රේඛා, මූලික සමෝච්ච රේඛා, අඩි පාර)

iv. ප්‍රධාන ගංගාව ගලන දිශාව කුමක්ද? ........................................................................ (ල. 1)

v. සිතියම්ගත කොටසේ කොටුකර ඇති ප්‍රදේශයෙහි දක්වෙන රාජ්‍ය ආයතන දෙකක් නම් කරන්න. (ල. 2)

vi. සිතියම්ගත ප්‍රදේශයේ ගිණිකොණ මායිමේ B 25 මාර්ගයේ විශේෂිත හැඩයට හේතුව ලියන්න. (ල. 2)
........................................................................................................................................
........................................................................................................................................

vii. සිතියම්ගත ප්‍රදේශයට උචිත/ සුදුසු රේඛීය පරිමාණය ඇඳ දක්වන්න. (ල. 2)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. A, B, C අක්ෂර අතරින් "ටිටිකාකා" විල දක්වෙන අක්ෂරය කුමක්ද?

ii. D, E, F යන අක්ෂර අතරින් "පූජියාමා ගිණිකන්ද" පිහිටි ප්‍රදේශය දක්වෙන අක්ෂරය කුමක්ද?

iii. G, H, I යන අක්ෂර අතරින් "කේතුධර වනාන්තර" ව්‍යාප්ත ප්‍රදේශයක් දක්වෙන අක්ෂරය කුමක්ද?

iv. J, K, L යන අක්ෂර අතරින් "අප්‍රිකා මහද්වීපයේ ජනාධිකම" නගරය දක්වෙන අක්ෂරය කුමක්ද?

v. M, N, O යන අක්ෂර අතරින් "මහා බාධක කොරල් පරය" දක්වෙන අක්ෂරය කුමක්ද?

(ඉ) ඔබ වෙත සපයා ඇති ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සිතියමෙහි A, B, C අක්ෂර අතරින් "බෙන්තොට" වෙරළ දක්වෙන අක්ෂරය කුමක්ද?

ii. සිතියමෙහි D, E, F යන අක්ෂර අතරින් "කෙඹලින් නිධිය" දක්වෙන අක්ෂරය කුමක්ද?

iii. සිතියමෙහි G, H, I යන අක්ෂර අතරින් "මිදි, ස්ටෝබෙරි" වැනි පළතුරු වගා කෙරෙන දිස්ත්‍රික්කය දක්වෙන අක්ෂරය කුමක්ද?

iv. සිතියමෙහි J, K, L යන අක්ෂර අතරින් "උඩරට තේ වගාව" කෙරෙන දිස්ත්‍රික්කය/ප්‍රදේශය දක්වෙන අක්ෂරය කුමක්ද?

v. සිතියමෙහි M, N, O යන අක්ෂර අතරින් "කුඹුක්කන් ඔය" දක්වෙන අක්ෂරය කුමක්ද?

(අ) කොටසට අදාල සිතියම




(ඉ) කොටසට අදාල සිතියම



## II කොටස

- **මෙම කොටසින් ප්‍රශ්න 4 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

(02) i. ශිලා ගෝලයේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල. 2)

ii. ශිලා ගෝලයෙහි ඇති සම්පත් මිනිසා ප්‍රයෝජනයට ගැනීමේදී ඊට ඇතිවන (ශිලා ගෝලයට) බලපෑම් තුනක් නම් කරන්න. (ල.3)

iii. a) පරිවර්තී ගෝලයෙහි හඳුනාගත හැකි විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 1)

b) වර්තමානයේ වායු දූෂණයට හේතුවන මානව ක්‍රියාකාරකම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(03) i. a) ආසියාවේ වී වගා කරන රටක්,

b) ආසියාවෙන් බැහැර වී වගා කරන රටක්, පිළිවෙලින් නම් කරන්න. (ල. 2)

ii. වී වගාව ආශ්‍රිතව හඳුනාගත හැකි විශේෂිත ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල. 3)

iii. a) ශ්‍රී ලංකාවේ වී වගාවේ දියුණුවට හේතු වී ඇති කරුණු දෙකක් සඳහන් කරන්න. (ල. 1)

b) ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(04) i. a) කර්මාන්ත ස්ථානගත වීමට බලපාන සාධක දෙකක් නම් කරන්න. (ල. 2)

b) ලෝකයේ රටවල කර්මාන්ත ක්ෂේත්‍රයෙහි පුනර්ජීවක් ඇති වීමට බලපෑ ප්‍රධාන කරුණ කුමක්ද? (ල. 1)

ii. ලෝකයේ ප්‍රධාන නිෂ්පාදන කර්මාන්ත දෙකක් නම් කරන්න. (ල. 2)

iii. a) ලෝකයේ නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිතව හඳුනාගත හැකි ගැටළු දෙකක් සදහන් කරන්න (ල. 1)

b) ශ්‍රී ලංකාවේ කාර්මික ක්ෂෙත්‍රයෙහි හඳුනාගත හැකි නව ප්‍රවණතාවයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(05) i. a) ලෝකයේ නිවර්තන වර්ෂා වනාන්තර ව්‍යාප්ත ප්‍රදේශයක්,

b) ලෝකයේ සෞම්‍ය කලාපීය වනාන්තර ව්‍යාප්ත ප්‍රදේශයක්, පිළිවෙලින් නම් කරන්න. (ල. 2)

ii. නිවර්තන වර්ෂා වනාන්තර විනාශ වීමට බලපාන මානව කටයුතු හා පාරිසරික සාධක දෙක බැගින් වෙන වෙනම සඳහන් කරන්න. (ල. 3)

iii. a) වනාන්තර හා වන ජීවී රක්ෂිත සංරක්ෂණ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ල. 2)

b) ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 3)

(06) i. උපත අනුව වර්ග කර ඇති පාෂාණ වර්ග දෙකක් නම් කරන්න. (ල. 2)

ii. a) ලෝහමය ඛනිජ වර්ග දෙකක් නම් කරන්න

b) තේ, රබර්, පොල් මෙන්ම කෝපි, කොකෝවා, කරදමුංගු, එනසාල්, කරාබුනැටි යන බෝග වගාවන්ටත් සුදුසු පස් වර්ගය කුමක්ද? (ල. 3)

iii. a) පස නිර්මාණයට බලපාන ප්‍රධාන සාධක දෙකක් සඳහන් කරන්න. (ල. 1)

b) පාංශු සංරක්ෂණ ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

පහත ප්‍රස්තාර සටහනට ඇසුරින් පිළිතුරු සපයන්න.




(07) i. a) ලෝක ජන සංඛ්‍යාවේ වර්ධනය වී ඇති ආකාරය දක්වෙන ඉහත ප්‍රස්තාරයට අනුව ජන සංඛ්‍යා වර්ධනයේ ප්‍රධාන වර්ධන අවධි 2 ක් හදුනාගත හැකියි. එම අවධි 2 නම් කරන්න. (ල. 1)

b) දෙවන අවධියේ ලෝක ජන සංඛ්‍යාව වර්ධනය වීමට බලපෑ ප්‍රධාන සාධකයක්/හේතුවක් සඳහන් කරන්න. (ල. 1)

ii. සංවර්ධිත රටවල ජන සංඛ්‍යා වර්ධනය අඩු වීමට බලපා ඇති හේතු තුනක් සඳහන් කරන්න. (ල. 3)

iii. a) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තියට බලපා ඇති කරුණු දෙකක් සඳහන් කරන්න. (ල. 2)

b) ඉන් එක් කරුණක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 3)

(08) i. "ලෝකයේ සංවර්ධනය මැනීම සඳහා වඩාත් ගුණාත්මක මිනුම් හඳුන්වා දී ඇත"

a) සංවර්ධනය මැනීමට භාවිතා කෙරෙන පැරණි මිනුමක් හා නූතන මිනුමක් පිළිවෙලින් නම් කරන්න. (ල. 2)

b) මානුෂ සංවර්ධන දර්ශකයට අයත් නිර්ණායක තුන සඳහන් කරන්න. (ල. 3)

ii. ශ්‍රී ලංකාවේ මෑත කාලීන සංවර්ධන ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ල. 2)

iii. දැනුම පදනම් කරගත් සංවර්ධනය තුළින් ලැබෙන පහසුකම් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 3)